010

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන-පස්වන මට්ටම - 2021/2022

අවසාන පරීක්ෂණය 2022

STU5317 - ළමා අයිතිවාසිකම්

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.11.25 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "ළමා අයිතිවාසිකම්" යන්න නිර්වචනය කරන්න.

02. ශ්‍රී ලාංකික ළමයින් අරභයා අයිතිවාසිකම් සුරැකීමට බ්‍රිතාන්‍ය රජය ගත් පියවර පහක් (05) දක්වන්න.

03. "වෙන්කොට නොසැලකීමේ මූලධර්මය" යන්නෙහි අර්ථය කුමක්දැයි දක්වන්න.

04. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි දක්වා ඇති පරිදි සුරක්ෂණය අවශ්‍ය ළමුන් කාණ්ඩ (05) නම් කරන්න.

05. ළමයින් සතු සහභාගිත්වය සඳහා ඇති අයිතිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

06. "විශේෂ අවස්ථාවන් හි පසුවන ළමයින්" ලෙස සලකනු ලබන්නේ කවරහු ද?

07. ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ සංයුතිය හා එහි මූලික කාර්යයන් තුනක් (03) ලියන්න.

08. පාසල් විද්‍යාගාරය තුළ දී ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විද්‍යා ගුරුවරයාට දැරිය හැකි වගකීම් පහක් (05) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09\. (i) පුරාතන යුගයේ ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් පිළිබඳ පැවති තත්ත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ශ්‍රී ලාංකික ළමයින් පිළිබඳ පැවැති තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ලන්දේසි යුගයේ දී ගන්නා ලද පියවර හතරක් (04) දක්වන්න. (ලකුණු 05 )

(iii) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම්වල පැවති තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා රජය විසින් ගන්නා ලද පියවර පැහැදිලි කරන්න. (ලකුණු 10)

10\. (i) ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි දක්වා ඇති අයිතිවාසිකම් කාණ්ඩ හතර (04) නම් කරන්න. (ලකුණු 05)

(ii) ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයේ ළමයින්ගේ සුරක්ෂණ අයිතිය පිළිබඳ විශේෂයෙන් සඳහන් වගන්තිවල අඩංගු වැදගත් කරුණු පහක් (05) ලියන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ ළමයින්ගේ සුරක්ෂණ අයිතිවාසිකම් ප්‍රවර්ධනය සඳහා රජය ගෙන ඇති පියවර පහක් (05) විස්තර කරන්න. (ලකුණු 10)

11\. (i) ළමා වර්ධනය හා සංවර්ධනය යන සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ළමයාට ජීවත්වීමට ඇති අයිතිය කෙරෙහි බලපාන මවගේ හා ළමයාගේ සෞඛ්‍යය හා පෝෂණ සාධක දෙකක් (02) නම් කර ඉන් එක් සාධකයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ පවතින වත්මන් තත්ත්වය තුළ මවගේ සහ දරුවාගේ සෞඛ්‍යය හා පෝෂණ තත්ත්වය සම්බන්ධයෙන්, ළමයාට ජීවත්වීමට ඇති අයිතිය කෙරෙහි බලපාන ගැටලු දෙකක් (02) උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න. ප්‍රජාවක් ලෙස එම ගැටලු මගහරවා ගැනීමට යෝජනා දෙකක් (02) ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

12. (i) "විශේෂ තත්ත්වයන්" යටතේ පසුවන ළමුන් හා "විශේෂ අවශ්‍යතා" සහිත ළමුන් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධයෙන් දෙමාපියන්ගේ භූමිකාව උදාහරණ තුනක් **(03)** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) විශේෂ තත්ත්වයන් යටතේ පසුවන ළමුන් සම්බන්ධයෙන් රජයේ කාර්යභාරය උදාහරණ හතරක් **(04)** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13. (i) ළමා අයිතිවාසිකම් පිළිබඳ ශ්‍රී ලාංකික ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු සන්නිවේදන උපායමාර්ග තුනක් **(03)** දක්වන්න. (ලකුණු 03)

(ii) ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රජාව දැනුවත් කල යුත්තේ ඇයි? උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ දී මාධ්‍යවේදීන් මුහුණ දෙන ගැටළු දෙකක් **(02)** උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

14. (i) පවුලක් නොමැති දරුවෙකුගේ ආරක්ෂාව හා භාරකාරත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නීති කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාව තුළ අවතැන් වූ දරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කෙටි විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 08)

(iii) ඉහත (ii) හි සඳහන් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගතයුතු පියවර යෝජනා කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.